# මධ්‍යම පරිසර අධිකාරිය
# மத்திய சுற்றாடல் அதிகாரசபை
# Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PR/39/2023 | ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. | දිනය / திகதி / Date 2023.04.10

## මාධ්‍ය නිවේදනය

### අවුරුදු නැකතට පැළයක් සිටුවා "අවුරුද්දට සිරිතක් - පරිසරයට පැළයක්" වැඩසටහන සමඟ එක්වෙමු....

2023 අප්‍රේල් මස 14 වන දිනට යෙදෙන අලුත් අවුරුද්දේ වැඩ ඇල්ලීමේ නැකතට සමගාමීව පැළයක් සිටුවා "අවුරුද්දට සිරිතක් - පරිසරයට පැළයක්" වැඩසටහන සමඟ එක්ව පරිසරය සුරැකීමේ මාහැඟි කාර්යයට එක්වන ලෙස මධ්‍යම පරිසර අධිකාරිය සියලුම ලක්වාසීන් ගෙන් ඉල්ලා සිටී. පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය එක්ව මෙම වැඩසටහන සංවිධාන කරයි. මෙම වැඩසටහන අප්‍රේල් මස 14 වන දිනට යෙදෙන වැඩ ඇල්ලීමේ නැකතෙන් ඇරඹෙන අතර අප්‍රේල් මස 20 වන දිනය දක්වා (20 දිනයද ඇතුළුව) සතියක කාලය තුළ දී පැළයක් සිටුවා ඕනෑම අයෙකුට වැඩසටහන සමඟ එක්විය හැකිය.

"අවුරුද්දට සිරිතක් - පරිසරයට පැළයක්" වැඩසටහන සමඟ ඕනෑම වයස් කාණ්ඩයකට අයත් පුද්ගලයෙකුට එනම් ළමා, තරුණ, වැඩිහිටි ඕනෑම පුද්ගලයෙකුට සම්බන්ධ වියහැකිය. ඖෂධ පැළයක්, දැවමය වටිනාකමකින් යුතු පැළයක්, පළතුරු පැළයක්, හෝ ආහාර අවශ්‍යතාව සපුරාලන පැළයක් මෙම වැඩසටහනට අදාළව රෝපණය කළ හැකිය. සිටුවන පැළය දීර්ඝ කාලීනව පවතින ශාකයක් වීම වැදගත් වේ. පැළය සිටුවනු ලබන්නාගේ නම, වයස, ලිපිනය, දිස්ත්‍රික්කය, ග්‍රාමසේවා වසම, දුරකථන අංකය, සිටුවන පැළයේ නම, සිටුවන අවස්ථාවේ පැළයේ උස යන තොරතුරු සමඟ පැළය සිටුවන අවස්ථාවේ ලබාගත් ඡායාරූපයක් gamadhushika@cea.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවීමෙන් මෙම වැඩසටහන සඳහා ඇතුළත්වී ලියාපදිංචිය ලබා ගත හැකිය.

පැළය සිටුවා මාස තුනක් ගතවූ පසු සිටවූ පැළයේ වර්ධනය, නඩත්තුව පිළිබඳ ඡායාරූපයක් අදාළ විද්‍යුත් ලිපිනයට එවීම මගින් ඇගයීම් ක්‍රියාවලියේ එක් කාර්ය සාධන අවස්ථාවක් සම්පූර්ණ වන අතර ඒ සඳහා විද්‍යුත් සහතියක් ලබාදෙනු ලැබේ. වසරකට පසු සමීක්ෂණයක් සිදුකරනු ලබන අතර විනිසුරු මඬුල්ලක් මගින් සෑම දිස්ත්‍රික්කයකම හොඳින් සරුවට වැඩුණු ශාක තෝරා පැළය රෝපණය කර නඩත්තු කළ පුද්ගලයින්ට ත්‍යාග සහ සහතික පත් ප්‍රදානය කිරීමට කටයුතු කරයි.

වැඩසටහනේ සමාරම්භක උළෙල පරිසර අමාත්‍ය ඉංජිනේරු නසීර් අහමඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් පරිසර අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සුපුන් එස්. පතිරගේ මහතා, සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා ඇතුළු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් අලුත් අවුරුදු දිනයේ වැඩ ඇල්ලීමේ නැකතට සමගාමීව මධ්‍යම පරිසර අධිකාරිය පරිශ්‍රයේදී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

පී. බී. හේමන්ත ජයසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම පරිසර අධිකාරිය


| | | | | | | |
|---|---|---|---|---|---|---|
| Chairman | Tel : 2872361, 2872348 Fax : 2872347 | Director General | Tel : 2872359 Fax : 2872608 | General Office | Tel : 2872278, 2873447, 2872419, 2873448 | Hotline for Inquiries : 2888999 Environmental Complaints: 1981 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| D.D.G | HRD.Admin. & Finance Tel: 2865296 Fax : 2877515 | Envt. Protection Tel :2873453 Fax : 2872605 | Envt. Mgt. & Assessment Tel :2872388 Fax : 2872296 | Envt. Edu. & Awareness Tel : 2872297 Fax : 2872609 | Waste Managment Tel : 2872409 Fax : 2882152 | Regional Oper. Tel : 2872370 Fax : 2872275 |




පරිසර අමාත්‍යාංශය | சுற்றாடல் அமைச்சு | Ministry of Environment